www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දිරිසුන්වූ අවස්ථාවාදීන් පිලිබඳ සඳහනක්

## A comment on demoralized opportunists

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2016 අප්‍රේල් 19**

ට්‍රොට්ස්කිවාදයට සතුරු ඇලෙක්ස් ටයිනර්ගේ හා ප්‍රැන්ක් බ්‍රෙනර්ගේ බ්ලොග් අඩවිය, ඔවුන්ගේ සහභාගිත්වයෙන් නිව් යෝර්ක්හි බෘක්ලීන් පෙදෙසේ දී අප්‍රේල් 12දා පැවත්වූ රැස්වීමක් වාර්තා කලේය. වාර්තාවට අනුවඃ

"සමස්ත සහභාගිත්වය 30-35 අතර වීම සංවිධායකයින්ගේ තෘප්තියට කාරනයක් වුව ද දොම්නසට හේතුව, නිව් යෝර්ක්හි ග්‍රීක ප්‍රජාවේ සාමාජිකයින්ගේ නියෝජනයක් නොතිබීමයි. නිසැකවම මෙය, සිරිසා ආන්ඩුව ඔවුන්ගේ බලාපොරොත්තු පාවාදීමේ ප්‍රතිපලයක් ලෙස බොහෝ ග්‍රීකයින් දැන් අත් විඳින දිරිසුන්කමට සම්බන්ධය."

ඉහත ඡේදය 2015 ජනවාරි හා ජූලි අතර කාලයේ ස්ටයින්ර් හා බ්‍රෙනර් සිය permanent-revolution.org (පර්මනන්ට්රෙවලූෂන් ඩොට් ඕර්ග්) බ්ලොග් අඩවියේ පල කල සියලු දේ පිලිබඳ අධි චෝදනාවකි. එම තීරනාත්මක සය මාසය තුල ඔවුන්, සිරිසාවේ පන්ති ස්වභාවය හෙලිදරව් කරමින් කම්කරු පන්තිය දැවැන්ත පාවාදීමකට ඇද දැමීම පිනිස ඔවුන් සැරසෙමින් සිටින බවට අනතුරු ඇඟවූ, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව "කට්ටිවාදීන්" ලෙස හෙලා දැකීම පිනිස, එම බ්ලොග් අඩවිය කැපකර තිබුනි. මාස ගනනාවක් තිස්සේ සිරිසාව පිලිබඳ "අත්දැකීම" හුවාදක්වමින් සිටි ඔවුහු, දැන්, එහි දේශපාලනයෙන් ඇතිව තිබෙන "දිරිසුන්කම" පිලිබඳව වැලපෙති.

ඔවුන්ගේ උපරිම, නැතිනම් යමෙකුට කිවහැකි තරකම හැකියාවෙන් ස්ටයිනර් හා බ්‍රෙනර්, එම දිරිසුන්කම සඳහා දායක වූහ.

2015 ජනවාරි 22දා ඔවුහු මෙසේ ලිවූහඃ

> සිරිසා නායකත්වයේ සම්මුතිවාදී ස්වභාවය, මැතිවරනය නියෝජනය කල ඓතිහාසික මාරුවේ පරිමාව ලඝු කරන්නේ නැත. පරම්පරාවකටත් වැඩි කාලයකදී පලමු වතාවට, "වාම" යයි හෝ "අති වාම" යයි කියාගත් දේශපාලන පක්ෂයක්, යුරෝපය තුල ජාතික මැතිවරනයක් දිනා ආන්ඩුවක් පිහිටුවීය. මැතිවරනයම ග්‍රීසිය විද්‍යුතනය කලේය... එලෙඹි අවස්ථාවන් කෙරෙහි කට්ටිවාදී කන්ඩායම් අන්ධව ඇත්තේ, ඔවුන් මහජන ව්‍යාපාරය ගැන උදාසීන බැවිනි. සිරිසාවේ මැතිවරන ජයග්‍රහනය සලකුනු කල පරිදි, එම මහජන ව්‍යාපාරය කඩා වැදුනු කල, ඔවුන් මෙම දිරවාගත නොහැකි සත්‍යය පලවා හැරීම පිනිස අතිකාල වැඩෙහි යෙදී ගනිති.

එසේම ඔවුහු, සිරිසා ආන්ඩුව පිලිබඳව හජාජාක අගැයීම ගැන ග්‍රීක අවස්ථාවාදියෙකු විසින් ලිවූ දීර්ග හෙලා දැකීමක් ද පල කලහඃ

> බලයට පත්වීමටත් පෙර එය හෙලා දැකීමට මත්තෙන් යමෙක්, ඉවසිලි සහගතව හා මේ අත්දැකීම ගෙන එනු ඇත්තේ කුමක්දැයි බැලිය යුතුය. දේශපාලන යථාර්තයන් හෙලා දක්මින් ද යුරෝපය තුල තේරී පත්වූ වමට නැඹුරු එකම ආන්ඩුවට සහාය නොදැක්වීම ද වමේ සතුරන්ට උදව් කිරීමක් පමනි. එය වනාහි දක්ෂිනාංශය විසින් වසර ගනන් යොදාගන්නා ලද, වමට හුරු පුරුදු දෙයකි. ඒ අනුව ගැලවීමේ එකම මග විප්ලවය හා කම්කරු පන්තියට සහාය දීම බව ජනගහනයෙන් බහුතරයකට ඒත්තු ගැන්වීමට වම දැක්වූ අසමත්කම අවධාරනය කිරීමකි.

ස්ටයිනර් හා බ්‍රෙනර් විසින් සිප්රාස් ආන්ඩුව ආරක්ෂා කිරීම, හජාජාක, සිරිසාව ධනපති පක්ෂයක් ලෙසට කරන ලද ගුනාංගීකරනයට එරෙහි වීම තරම් දුර ගමන් කලේය. ඔවුහු මෙසේ ලිවූහඃ

> මාක්ස්වාදීහු "ධනේශ්වර පක්ෂය" වැනි ප්‍රවර්ගයක් යොදා ගත්තේ, දේශපාලන යථාර්තය වඩාත් ගැඹුරෙන් වටහා ගැනීමටය. එහෙත් කට්ටිවාදියාගේ අතෙහි එවන් ප්‍රවර්ගයක්,

අන්තර්ගතයෙන් හිස්, නම් පටබැඳීමකට සුලු වශයෙන් නොවැඩි දෙයක් බවට පත්වේ.

ප්‍රහාරයේ මෙම පිලිවෙත 2015 වසර පුරාවටම අනුගමනය කරන ලදී. එහෙත් දැන්, කිසිදු පැහැදිලි කිරීමකින් තොරවම ඔවුන්, සිරිසා ආන්ඩුව විසින් සිදුකර ඇති පුලුල්ව පැතිරි දිරිසුන්කම ගැන ලියයි.

ස්ටයිනර් බ්‍රෙනර්ගේ රැස්වීමෙහි කුලුගැන්වීම ග්‍රීසියේ කම්කරු විප්ලවවාදී පක්ෂයේ නායක සවාස් මයිකල් විසින් ඇතන්ස්හි සිට ස්කයිප් මාධ්‍යයෙන් රැස්වීම අමතා කල කථාවයි. මයිකල් ස්ටයිනර්ගේ දේශපාලන සහචරයෙකු වන අතර ඔවුන්ගේ මූලධර්මාත්මක බැඳීම, ජාත්‍යන්තර කමිටුව කෙරෙහි වන වෛරය බෙදා හදා ගැනීමයි.

ස්ටයිනර් හා බ්‍රෙනර් මෙන්ම මයිකල් ද 2015දී සිරිසා තන්ත්‍රය දීප්තිමත් වර්නයෙන් පින්තාරු කල අතර ජාත්‍යන්තර කමිටුවේ අනතුරු ඇඟවීම් හෙලා දුටුවේය. එහෙත් ප්‍රමෝදය වේදනාවට ඉඩ හැර අයින්වී ඇත. වාර්තාවට අනුව මයිකල්, "එම පාවාදීම, ස්ටැලින්, චර්චිල් හා රූස්වෙල්ට් විසින් අඳින ලද ගිවිසුම ප්‍රකාරව, 1944 ග්‍රීක පාටිසන්වරු පාවාදීමට සමාන වන අතර පසුව ග්‍රීක ස්ටැලින්වාදීන් 1945දී සිවිල් යුද්ධයේ සටන්කරුවන්ට සිය අවි බ්‍රිතාන්‍යයන් වෙත බාරදීමට බලකරමින් සිදුකල ඊටත් වඩා නරක පාවාදීමට සමානය" යනුවෙන් පැවසීය.

ඓතිහාසිකව සාවද්‍ය සාදෘෂ්‍යයන් සිරිසාවේ පාවාදීම බොඳ නොකරයි. ග්‍රීසිය තුල හිඟයක් නැති අවස්ථාවාදී දේශපාලන වර්ගයකට සවාස් මයිකල් අයත්වේ. ඔහු හිතන්නේ දේශපාලන විශ්ලේෂනය සිය පෙනහලුවල හයියෙන් හා බෙරිහන් දීමෙන් ව්‍යාකූල කල හැකිය කියාය. සිරිසා තන්ත්‍රයේ විප්ලවවාදී ශඛ්‍යතා සැමරීමට 2015 වසර පුරා වෙහෙස නොබලා කැපව සිටීමෙන් පසුව ඔහු දැන්, පශ්චාත් ජනමත විචාරන අවධියේ තත්වය, කම්කරුවන් ලක්ෂ ගනනකගේ ජීවිත බිලිගත් ග්‍රීක සිවිල් යුද්ධයේ ව්‍යසනකාරී සිදුවීම් සමග සංසන්දනය කරයි. මෙය වනාහි උමතු අතිශයෝක්තියකි. එයින් වත්මන් දේශපාලන තත්වයේ කිසිවක් පැහැදිලි කරන්නේ නැත.

මයිකල් තමන්ගේම අතිශයෝක්තීන් වුවත් සැබවින්ම බැරෑරුම්ව නොසලකයි. ස්ටයිනර් බ්‍රෙනර් බ්ලොග් අඩවියට අනුව, 2015 ජූලි පාවාදීම 1940 ගනන්වල ග්‍රීක කම්කරු ව්‍යාපාරයේ විනාශය සමග සසඳමින් මයිකල්, " කම්කරු පන්තිය පාවාදී තිබුන ද ඔවුන් පරාජයට පත් කර නැති බව සැලකිය යුතුය" යනුවෙන් සඳහන් කරයි.

මෙය වනාහි නරකම වර්ගයේ විතන්ඩවාදයකි. 1940 ගනන්වල විනාශයට සමාන "පාවාදීමකට" කම්කරු පන්තිය නාමිකව මුහුන දුන් බව කියා සිටින ඔහු ඔවුන් පරාජයකට මුහුන නොදුන් බව පවසයි.

මයිකල්ගේ දේශපාලන ඉතිහාසයට හුරු පුරුදු අය, ඔහුගේ "පාවාදීම" හා "පරාජය" අතර නරුම සුවිශේෂත්වයේ මූලාශ්‍රය හඳුනාගනු ඇත. කම්කරු පන්තිය අත් විඳි සෑම පරාජයකම දේශපාලන අර්ථභාරය හා බලපෑම යට ගැසීම පිනිස "කම්කරු පන්තියේ අපරාජිත ස්වභාවය" ගැන, පැබ්ලෝවාදය කරා සිය පල්ලම් බැසීමේ අවධිය තුල ජෙරී හීලි කල කථා වලින් ඔහු මේ අවස්ථාවාදී වචන සෙල්ලම ඉගෙන ගත්තේය. මෙම දේශපාලන තකතිරුකම දිවගාන සවාස් මයිකල්, එසේ කරන්නේ මුග්ධකම නිසාම නොව, තමන්ගේම අවස්ථාවාදයේ ප්‍රතිවිපාක පිලිබඳ දේශපාලන වගකීමෙන් පැන යාමට ද ඉන් ඔහුට අවස්ථාවක් සැලසෙන බැවින්ය. වඩාත් පුද්ගලික අර්ථයෙන් මයිකල්ට කිසිදු හානියක් සිදු නොවනතාක් දුරට කම්කරු පන්තියේ පාවාදීම් "පරාජයන්ට" සමාන නොවේ. හුදු පාවාදීමේ අර්ථය, කම්කරු පන්තියේ ජීවන තත්වයන් පිරිහී යාමයි. පරාජය සිදු වන්නේ, තමන්ගේ ජනප්‍රිය ඇතන්ස් ආපන ශාලාවකදී සිය ව්‍යාජ-අපෝහකවාදී දෙඩවිලි ප්‍රසිද්ධියේ දෙසාබෑමට මයිකල්ට තවදුරටත් නොහැකිවන අවස්ථාවකය.

2015 ජූලියේදී ග්‍රීක කම්කරු පන්තිය දේශපාලන පරාජයකට මුහුනදී ඇති බව පැවසූ ජාත්‍යන්තර කමිටුව හෙලා දුටු ස්ටයිනර් හා බ්‍රෙනර්, 2015 සිදුවීම් අවධියේ සිය දේශපාලන භූමිකාව පිලිබඳ කිසිදු සටහනක් සපයා ඇත්තේ නැත. සිරිසා ආන්ඩුවේ සාපරාධී දෙපිටකාට්ටුව හෙලිදරව් කල ජාත්‍යන්තර කමිටුවට පහර දීම සඳහා තම සියලු දේශපාලන ශක්තිය මෙහෙයවූයේ මන්දැයි පැහැදිලි කිරීමට ද ඔවුහු අසමත් වෙති.

© www.wsws.org